Nestlé Lanka PLC News Release

Colombo: 20 May 2016

# මැගී තම ගමන් මගෙහි වැදගත් මංසලකුණක් සනිටුහන් කරමින් මව්වරුන් වෙනුවෙන් මැගී වෙබ් අඩවිය එළිදක්වයි

*අන්තර්ජාලයෙන් ආහාර වට්ටෝරු සහ පෝෂණ ඉඟි ලබා දෙමින් ගෘහණියන් සවිබලගන්වයි*

ශ්‍රී ලංකාවේ ඉහළම ජනාදරයක් දිනාගත් ආහාර සන්නාමයක් වන මැගී, ශ්‍රී ලාංකික කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් කටයුතු කරන්නේ වසර 30කට අධික කාලයක සිටයි. මෙවර මව්වරුන්ගේ දිනයේදී මැගී තම වෙබ් අඩවිය වන www.maggi.lk එළිදක්වමින් නූතන යුගයේ සුවහසක් මව්වරුන්ට ඉක්මනින් සහ පහසුවෙන් ආහාර වට්ටෝරු ලබාගැනීමේ අවස්ථාව ලබා දෙන ලදි. මැගී විසින් මව්වරුන්ගේ දිනයේදී සංවිධානය කළ විශේෂ වැඩසටහනට සහභාගි වූ මව්වරුන් විසින් මෙම වෙබ් අඩවිය දියත් කිරීමද තවත් සුවිශේෂී සිදුවීමකි.

ඩිජිටල් යුගයට ගැලපෙන ලෙස දියත් කළ මැගී වෙබ් අඩවිය මගින් කාර්යබහුල ගෘහණියන්ට තම වටිනා කාලය ඉතිරිකරගැනීමට රසවත් හා පහසුවෙන් සෑදිය හැකි ආහාර වට්ටෝරු රැසක් ලබා ගැනීමේ අවස්ථාව සැලසේ. සම්ප්‍රදායික ශ්‍රී ලාංකික ආහාර වට්ටෝරුවල සිට ජාත්‍යන්තර ආහාර වට්ටෝරු දක්වා ආහාර වට්ටෝරු රැසක් එහි අන්තරගත වේ. දෛනික ඉවුම් පිහුම් රටාව වඩාත් සතුටුදායක කරගැනීමට ළමුන් සමග ඉවුම් පිහුම් කිරීමේ ඉඟි සහ සෑම ආහාර දීසියකම අන්තර්ගත පෝෂණ තොරතුරු ලබා දීමද මෙයින් සිදුකෙරේ.

''පරම්පරා ගණනාවක් තිස්සේ ශ්‍රී ලාංකීය මව්වරුන් විසින් භාවිතා කළ සම්ප්‍රදායික ආහාර වට්ටෝරු ඩිජිටල් මාධ්‍ය ඔස්සේ හඳුන්වා දෙන්නට ලැබීම පිළිබඳව අපි ආඩම්බර වෙනවා. අපේ වෙබ් අඩවිය මගින් නවීන යුගයේ මව්වරුන්ට ශ්‍රී ලාංකික ආහාර නව්‍ය ආකාරයට ඉවුම් පිහුම් කිරීමේ කලාව මෙයින් ඉගෙන ගැනීමට ලැබෙනවා. අපේ වෙබ් අඩවියේ ඇති විශේෂ පහසුකමක් වන්නේ එය භාවිතා කරන්නාට තමන් කැමති ආහාර වර්ගය, පිළියෙල කිරීමට ගතවන කාලය සහ ආවේණික රට අනුව ආහාර වට්ටෝරු තෝරා ගැනීමට හැකියාව ලැබීමයි. ඒ විතරක් නෙවෙයි පෝෂණ අගයන් පිළිබඳ දැනුවත් විය හැකි වීම, කැලරි ප්‍රමාණය සහ සෑම වට්ටෝරුවකම තිබෙන සෞඛ්‍යමය අගය දැන ගෙන ඉවුම් පිහුම් කරගැනීමේ හැකියාව නිසා මෙම වෙබ් අඩවිය ඉවුම් පිහුම් සම්බන්ධයෙන් සෑම අංශයක්ම ආවරණය කරන බව කියන්න පුළුවන්.'' යනුවෙන් මැගී වෙබ් අඩවිය දියත් කිරීම පිළිබඳව අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය උප සභාපති - ආහාර, ප්‍රියදර්ශිනී කරුණාරත්න මහත්මිය පැවසුවාය.

දශක තුනකට අධික කාලයක සිට ශ්‍රී ලාංකික මව්වරුන් සවිබලගන්වමින් ඔවුන්ගේ පවුල් වෙත රසයෙන් සහ පෝෂණයෙන් යුතු ආහාර විසඳුම් ලබාදීමට මැගී කටයුතු කරයි. 'මැගී ඩෙවිල්ඩ්' ෆේස්බුක් පිටුව හඳුන්වාදෙමින් ඩිජිටල් අවකාශයට පැමිණ වසර තුනක් සම්පූර්ණවන විට සමාජ ජාල මාධ්‍යයන්හි තම සාර්ථකත්වය මැනවින් පෙන්වන්නට සමත්වූ මැගී තම ඩිජිටල් ගමන් මගෙහි තවත් වැදගත් සංධිස්ථානයක් මෙම වෙබ් අඩවිය හඳුන්වාදෙමින් සනිටුහන්කර තිබේ.

පසුගියදා පැවැති ස්ලිම් - නීල්සන් (SLIM – Nielsen) ජනතා සම්මාන උළෙලේදී පිට පිටම සිව්වැනි වරටත් 'වසරේ ආහාර සන්නාමය' සම්මානයෙන් මැගී සන්නාමය පිදුම් ලැබීය. ශ්‍රී ලාංකිකයන් මැගී කෙරෙහි තැබූ ස්ථිර විශ්වාසය සහ වෙනස්වන පාරිභෝගික ජීවන රටාවේ අවශ්‍යතා අනුව කටයුතු කළ යුතු ආකාරය මැගී සාර්ථකව හඳුනාගත් බව එම සම්මානය හරහා මැනවින් පැහැදිලි වේ.